රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ඇබෑර්තු

**අධ්‍යක්ෂ ජනරාල් (01) - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - SLIDA**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>සුදුසුකම් සහ නිපුණතාවන්</u>**

**<u>(බාහිර අයදුම්කරුවන්)</u>**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිත රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ විධායක/ කළමනාකරණ තනතුරුවල වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 2-1) පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළ පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම සහ විධායක/ කළමනාකරණ තනතුරුවල වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් අවුරුදු පහක (05) කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම. (රා.සේ.කො.ස. කාර්ය පටිපාටික රීති I කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදය පරිදි මුදා හැරීමක දී)

**<u>(අභ්‍යන්තර අයදුම්කරුවන්)</u>**

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂය පථයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ/ විධායක මට්ටමේ නිලධාරියෙකු වශයෙන් වසර 20ක පළපුරුද්ද සහ ඉන් වසර තුනක් (03) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන් සේවය කර තිබීම.

(ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි විෂය පථය යනුවෙන් අදහස් කරනුයේ මානව සම්පත් කළමනාකරණ/ ව්‍යාපාර කළමනාකරණ/ පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණය/ රාජ්‍ය පරිපාලන/ වාණිජ්‍ය/ ආර්ථික විද්‍යා/ දේශපාලන විද්‍යා/ සමාජ විද්‍යා/ නීති ආදි විෂයන් වේ.)

**<u>සෑම අයදුම්කරුවෙකුම,</u>**

- වයස අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සහ රජයේ සේවකයන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.
- තනතුරට බඳවා ගැනීම සඳහා සපුරා තිබිය යුතු සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.
- සියලු දත්ත ඇතුළත් ජීව දත්ත පත්‍රිකාව සමඟ අයදුම්පත්‍රය 2026 ඔක්තෝබර් මස 16 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලූ කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි “ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර” යන්න සඳහන් කළ යුතුය.

**එස්. ආලෝකබණ්ඩාර**

ලේකම්

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය